# මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

# වාර්ෂික වාර්තාව - 2022

**ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය**

**අංක 01,**

**ඩී.ආර්. විජේවර්ධන මාවත,**

**කොළඹ -10.**

## දැක්ම

සැමට සුරක්ෂිත මාර්ග පද්ධතියක්

## මෙහෙවර

තිරසර සංවර්ධනය උදෙසා මාර්ග අනතුරුවලින් තොර සමාජයක් බිහිකිරීම.

# මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කාර්යාලය

අංක 01, ඩි.ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10, යන ලිපිනයේ පිහිටි ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයට අයත් පරිශ්‍රයේ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව පිහිටුවා ඇත.


කාර්යාලීය ලිපිනය -

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව,
අංක 01,
ඩී.ආර්. විජේවර්ධන මාවත,
කොළඹ -10.

| | | |
|---|---|---|
| දුරකතථනය අංකය | - | 0112696890 / 01126887109 / 0112674162 |
| ෆැක්ස් අංකය | - | 0112680163 |
| විද්‍යුත් තැපැල් ලිපිනය | - | ncrstransport@gmail.com |

# පටුන

## වාර්ෂික වාර්තාව - 2022
## (2022.01.01 සිට 2022.12.31)


| විස්තරය | පිටු අංකය |
|---|---|
| හැඳින්වීම | 04 |
| මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ සභා සාමාජික සංයුතිය | 05 |
| මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කාර්ය මණ්ඩලය | 06 |
| මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ අරමුණ | 07 |
| මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කර්තව්‍යයන් හා බලතල | 08 |
| මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ක්‍රියාකාරකම් | 09 – 23 |
| මාර්ග අනතුරු දත්ත | 24 - 25 |
| මාර්ග ආරක්ෂණ අරමුදලට දායකත්වය සපයනු ලබන ලියාපදිංචි රක්ෂණ සමාගම් | 26 |
| අවසන් ගිණුම් | 27 – 42 |
| විගණකාධිපති වාර්තාව | 43 – 50 |
| විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු | 51 - 53 |

# මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

## හැඳින්වීම

1998 අංක 05 දරන මෝටර් වාහන සංශෝධන පනතේ 213 අ සහ 213 ආ වගන්ති යටතේ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ පාලනය වන ආයතනයක් ලෙස ස්ථාපනය කර ඇත. ඒ අනුව මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ප්‍රවාහන විෂය භාර අමාත්‍යතුමන් විසින් පත් කරනු ලබන සභාපතිවරයෙකු ඇතුළුව රාජ්‍ය ආයතන 16 ක සහ එක් රාජ්‍ය නොවන ආයතනයක නියෝජිතයෙකු ඇතුළු නියෝජිතයන් 17 කින් සමන්විත ආයතනයකි. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව නියෝජනය කරන මෙම සියලු ආයතන මෙරට ප්‍රවාහන හා මාර්ග ආරක්ෂාව විෂය පිළිබඳ වගකිවයුතු රාජ්‍ය ආයතන වේ. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය වන ආදායම් ලබා දෙනු ලබන්නේ ශ්‍රී ලංකාව තුළ රක්ෂණ නියාමන කොමිෂන් සභාව මඟින් නියාමනය වන රක්ෂණ ආයතන මගින් වන අතර, 2004 නොවැම්බර් 24 දිනැති අංක 1368/18 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ අරමුදල පිළිබඳව සඳහන් වේ. එහි සඳහන් පරිදි , ‘‘තෘතීය පාර්ශවයේ අවධානමක් සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි රක්ෂණ ඔප්පුවක් හෝ ඇපයක් රක්ෂණය කරන සෑම රක්ෂණ ආයතනයක් විසින්ම මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ අරමුදලට වාරික මුදලින් සියයට එකක් (1%) දායක මුදල් වශයෙන් ගෙවනු ලැබිය යුතුය.’’ ඒ අනුව ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය යටතේ ලියාපදිංචි වී ඇති සියලුම රක්ෂණ සමාගම් තම ආයතන මගින් රක්ෂණය කරනු ලබන තෙවන පාර්ශවීය සියලුම වාහන සඳහා අය කෙරෙන රක්ෂණ ගාස්තු මුදලින් 1% ක වටිනාකමින් යුත් මුදල 2004 දෙසැම්බර් 01 දින සිට බලාත්මක වන පරිදි මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා අරමුදලට බැර කළ  අතර, 2021 සැප්තැම්බර් 17 වන දින ප්‍රවාහන අමාත්‍යතුමිය විසින් නිකුත් කරන ලද අංක 2245/31 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් එම රක්ෂණ දායකත්ව මුදල  2021 ඔක්තෝම්බර් 01 දින සිට 2% දක්වා වර්ධනය කිරීමට කටයුතු කර ඇත.

මෙම අරමුදල මගින් ඉටු කළයුතු කාර්යභාරයන් පිළිබඳව 2005 අප්‍රේල් 04 වන දින නිකුත් කරන ලද අංක 1387/04 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් කර ඇත. ඉන් එක් වගකිවයුතු ප්‍රධාන කාර්යයක්  වනුයේ මාර්ග අනතුරු සිදු කර නොනවත්වා පලා යන වාහන හඳුනාගත නොහැකි බව තහවුරු කර ගැනීමෙන් අනතුරුව එම වාහන අනතුරු වලට ගොදුරු ව මියගිය හෝ ආබාධිත තත්වයට පත් පුද්ගලයන්ට සභාව මඟින් අනුමැතිය ලබා දී ඇති ආකාරයට වන්දි මුදල් ප්‍රදානය කිරීමයි.

මාර්ග ආරක්ෂාව තහවුරු කිරීම, අනතුරු අවම කිරීම, පදික හා මඟී ජීවිත අනතුරු වලට ලක්වීම වළක්වා ගැනීම, මහජනයා දැනුවත් කිරීම ඒ සඳහා අවශ්‍ය නව නීති ඇතුලත් කිරීම හෝ දැනට තිබෙන නීති සංශෝධනය කිරීම සඳහා විෂය භාර අමාත්‍යතුමන්ට උපදෙස් ලබාදීම ඇතුළු සමස්ථයක් ලෙස සියලුම පීඩාකාරී ක්‍රියා බැහැර කරමින් මාර්ග ආරක්ෂාව තහවුරු කිරීමේ කාර්යයන් සඳහා මෙම අරමුදලෙහි තැන්පත් වන මුදල් ප්‍රයෝජනයට ගතහැකි වනු ඇත.

එසේම මාර්ග ආරක්ෂාව පිළිබඳ සියලු පරිපාලන හා අනෙකුත් වියදම් දැරීම ද මෙම අරමුදල මඟින් සිදු කළ යුතුය.

## මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා සාමාජිකයන්

| | | |
|---|---|---|
| 01. ආර්.එල්.ඇන්ටන් ද මෙන්ස් මහතා | - | සභාපති, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව. |
| 02. අර්.ඒ.කේ.රේණුකා මිය | - | ලේකම් , මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව. |
| 03. එච්.පි. ශිරෝමි රත්නායක මෙනවිය | - | ගණකාධිකාරී,මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව. |
| 04. ආර්.එම්.එම්.රත්නායක මහතා | - | අතිරේක ලේකම් (පාසල් කටයුතු). අධ්‍යාපන අමාත්‍යාංශය. |
| 05. එම්.එම්.නයිමුදීන් මහතා | - | අති. ලේකම් (ව්‍යාපෘති අධීක්ෂණ), පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය. |
| 06. සුමිත් සි.කේ. අලහකෝන් මහතා | - | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව. |
| 07. කේ.ජී.සුමුදු දිනේෂා මිය | - | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ( පාලන), ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය . |
| 08. එච්.ඒ.කේ.ඒ.ඉන්දික හපුගොඩ මහතා | - | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, (අධ්‍යක්ෂ,රථ වාහන පාලන හා මාර්ග ආරක්ෂාව ) ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව. |
| 09. ආචාර්ය . එච්.ආර්.පසිඳු මහතා | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මොරටුව විශ්වවිද්‍යාලය. |
| 10. ශශී වෙල්ගම මහතා | - | සභාපති, ජාතික ගමනාගමන කොමිෂන් සභාව. |
| 11. ධම්මික ආටිගල මහතා | - | සභාපති, ශ්‍රී ලංකා ඔටෝ මොබයිල් සංගමය. |
| 12. ගිහාන් රාමනායක මහතා | - | සභාපති, ශ්‍රී ලංකා අනතුරු වැළැක්වීමේ සංගමය. |
| 13. සි.පි.අයි.ද සිල්වා මිය | - | ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරී , ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව. |
| 14. ජී.ජී.එම්.කුලතිලක මහතා | - | ප්‍රධාන විධායක නිලධාරි, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය. |
| 15. කේ.එස්.එම්.සමරසේකර මිය | - | ප්‍රධාන වෛද්‍ය නිලධාරී, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය. |
| 16. එම්.එෆ්.ඒ.මුබාරක් මහතා | - | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, (ආවරණ) ජාතික අයවැය දෙපාර්තමේන්තුව,මුදල් අමාත්‍යාංශය. |
| 17. ජී.ඩබ්.ජී. අබේගුණවර්ධන මහතා | - | අධ්‍යක්ෂ (නාගරික සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති) නාගරික සංවර්ධන අධිකාරිය. |
| 18. ඩී.එම්.කේ.එස්. දිසානායක මහතා | - | අධ්‍යක්ෂ(ඉංජිනේරු),මහා මාර්ග අමාත්‍යාංශය. |
| 19. පි.ඒ.චන්ද්‍රපාල මහතා | - | අධ්‍යක්ෂ ඉංජිනේරු(රථ වාහන නිර්මාණ හා මාර්ග ආරක්ෂණ), කොළඹ මහ නගර සභාව. |
| 20. ආර්.ඒ.සුදත් මහතා | - | අධ්‍යක්ෂ (යටිතල පහසුකම් සංවර්ධන හා මාර්ග ආරක්ෂාව කළමනාකරණය) මාර්ග සංවර්ධන අධිකාරිය. |

**මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කාර්යමණ්ඩලය.**

| | | |
|---|---|---|
| 01. සභාපති | - | 01 |
| 02. ලේකම් | - | 01 |
| 03. ගණකාධිකාරී | - | 01 |
| 04. සංවර්ධන නිළධාරි | - | 10 |
| 05. කළමනාකරණ සේවා නිලධාරි | - | 01 |
| 06. ලිපිකරු | - | 01 |
| 07. තාක්ෂණ ශිල්පී සහයක | - | 02 |
| 08. කාර්යාල කාර්යය සහයක | - | 01 |
| 09. දුම්රිය කාර්ය සහයක | - | 01 |

## මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ අරමුණු

- විනය ගරුක හා නීති ගරුක රියදුරන් බිහි කිරීම තුළින් ඉහළ ගුණාත්මක රියදුරු සේවාවක් බිහි කිරීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීම.
- හප්පා පලා යෑම නිසා වින්දිත වූ පවුල් සඳහා මූලාධාර ලබා දීම සහ එවැනි අනතුරු අවම කිරීමට ක්‍රියාකිරීම.
- මාර්ගය සහ එය භාවිත කරන වාහන හා ගමන් ගන්නා මගීන් ඇතුළු පදිකයින්ගේ ආරක්ෂාව සඳහා ගත හැකි ක්‍රියාමාර්ග හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම.
- මාර්ග ආරක්ෂාව පිළිබඳ දත්ත එක් රැස් කිරීම, සමීක්ෂණ හා පර්යේෂණ පැවැත්වීම සහ අන්තර් ජාතික සම්බන්ධීකරණය වර්ධනය කර ගැනීම.
- රාජ්‍ය අංශය, රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික ආයතන සමග එක්ව ජාතික මාර්ග ආරක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම හා පැන නැගෙන දුර්වලතා අවම කර ගැනීම.
- මාර්ග අනතුරු නිසා ආබාධිත තත්ත්වයට පත්වන පුද්ගලයින් පුනරුත්ථාපනය කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.
- මාර්ග ආරක්ෂාව තහවුරු කිරීම හා මාර්ග අනතුරු අවම කිරීමට අදාලව ආර්ථික තාක්ෂණික සහ සමාජීය වශයෙන් ක්‍රියාත්මක කළ හැකි ක්‍රියාකාරකම් සහ පරිසර හිතකාමී ආරක්ෂිත පියවර අනුගමනය කිරීම සඳහා මූලාධාර සහ උපදෙස් ලබාදීම.
- ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තිය සැකසීමට හා එහි ක්‍රියාකාරීත්වයට දායකත්වය ලබා දීම.
- මාර්ග ආරක්ෂාවට අදාල නීති සැකසීම සංශෝධනය වැනි ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය දායකත්වය ලබා දීම.

## මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කර්තව්‍යයන් හා බලතල

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව සතු කාර්යභාරය හා කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් බලය ලබා දී ඇත්තේ 2005 අප්‍රේල් 04 වන දින නිකුත් කරන ලද අංක 1387/4 දරන රජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගිනි. එම ගැසට් පත්‍රය මගින් නියෝග කර ඇති පරිදි මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මඟින් සිදුකළයුතු කර්තව්‍යයන් පහත පරිදි වේ.

(අ) පහත දැක්වෙන දෑ පිළිබඳ පරිගණක දත්ත ගබඩාවක් පවත්වා ගෙන යෑම.

I. රථ වාහන ප්‍රමාණය සහ ඒවායේ ලක්ෂණ සහ සංයුතිය.

II. මාර්ග අනතුරු

III. මාර්ග ආරක්ෂාව පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර සංඛ්‍යා ලේඛන.

(ආ) මාර්ග ආරක්ෂාව විෂය පිළිබඳ පුස්තකාලයක් පවත්වාගෙන යෑම.

(ඇ) සම්බන්ධිත විෂයන් පිළිබඳ තොරතුරු රැස් කිරීම, පර්යේෂණ පැවැත්වීම සහ ක්ෂේත්‍ර පරීක්ෂණ පැවැත්වීම.

(ඈ) සම්බන්ධිත විෂයන් පිළිබඳ පර්යේෂණ වලට ආධාර කිරීම.

(ඉ) සමාන ජාත්‍යන්තර ආයතන සමග සබඳතා පැවැත්වීම සහ පළපුරුද්ද පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම.

(ඊ) මාර්ග ආරක්ෂාව සහ සම්බන්ධිත විෂයානුබද්ධ ව්‍යාපෘති කෙරෙහි වගකීම දරන රාජ්‍ය සහ රාජ්‍ය නොවන අදාල ආයතන වලට දැනුම හා තොරතුරු ලබාදීම.

(උ) මාර්ග ආරක්ෂාව පිළිබඳ ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාවට නැංවීම.

(ඌ) රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන තුළ මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත කාර්යයන් සම්බන්ධීකරණය කිරිම.

(ඔ) හඳුනා නොගත් වාහන වලින් අනතුරට පත් තැනැත්තන්ට වන්දි ගෙවීම.

(ඕ) මාර්ග ආරක්ෂාව පිළිබඳ කටයුතු සඳහා මූල්‍යමය හා වෙනත් සහාය ලබා ගැනීම.

(එ) මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත ප්‍රතිපත්තීන් සහ ව්‍යාපෘති පිළිබඳව රජයට උපදෙස් ලබාදීම.

## 2022 වර්ෂය තුළ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ක්‍රියාකාරකම්.

### 01. මාර්ග අනතුරු අවම කිරීම පිළිබඳව පර්යේෂණ සිදුකිරීම.

යතුරුපැදි අනතුරු අවම කිරීම සඳහා වන පර්යේෂණ කාර්යයේ දෙවන අදියර සඳහා වන වාර්තාව මොරටුව විශ්වවිද්‍යාලයේ සිවිල් ඉංජිනේරු පීඨය මඟින් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව වෙත යොමු කර ඇත.


දෙවන පර්යේෂණ කාර්යය ලෙස “පදිකයින්ගේ අනතුරු අවම කර ගැනීම” සඳහා වන පර්යේෂණ දෙක ක්‍රියාත්මක කිරීමට අදාල පර්යේෂණ යෝජනාවලිය (Project Proposal) සහ පුවත්පත් දැන්වීම උපදේශන ප්‍රසම්පාදන කමිටුව විසින් සකස් කරමින් පවතී.



යතුරුපැදි අනතුරු අවම කර ගැනීම සඳහා වන පර්යේෂණ කාර්ය සම්බන්ධයෙන් රැස්වීම් පැවැත්වීම.

### 02. දිවයින පුරා ආවරණය වන පරිදි ශ්‍රී ලංකා පොලිසිය හා එක්ව මාර්ග රිය අනතුරු දත්ත කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කිරීම.

ශ්‍රී ලංකා රථ වාහන පොලිස් මූලස්ථානය මඟින් බස්නාහිර සහ මධ්‍යම පළාත් තුළ දැනට ක්‍රියාත්මක “ශ්‍රී ලංකා දත්ත විශ්ලේෂණ කළමනාකරණ පද්ධතිය **(SLADMS)** ” දිවයින පුරා ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා පොලීසියට අවශ්‍ය තාක්ෂණික උපකරණ මිලදී ගැනීම සඳහා වන ලංසු කැඳවීමේ පුවත්පත් දැන්වීම පලකිරීමට සුදානම් කර ඇත.



මාර්ග රිය අනතුරු දත්ත කළමණාන පද්ධතිය ස්ථාපිත කිරීම.

## 03. <u>මාර්ග ආරක්ෂාව පිළිබඳව වන විද්‍යුත් පුස්තකාලය යාවත්කාලීන කිරීම.</u>

මාර්ග ආරක්ෂාවට අදාලව විද්‍යුත් පුස්තකාලය(**E-Library) 2021.12.01** දින පැවති ජාත්‍යන්තර වින්දිතයින් සිහිකිරීමේ දිනයට සමගාමීව කොට්ටාව මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ පැවති සැමරුම් උළෙලට සමගාමීව ස්ථාපිත කරන ලදි.

විශ්වවිද්‍යාල මඟින් මාර්ග රිය අනතුරු අවම කිරීම සම්බන්ධයෙන් වන නිබන්ධන 16ක් විද්‍යුත් පුස්තකාලය වෙත ඇතුලත් කර ඇත. (**Upload)**

## 04. <u>ග්‍රාමීය මාර්ග ආශ්‍රිතව සිදුවන මාර්ග රිය අනතුරු ඉහළ යාම පාලනය කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් ව්‍යුහයක් සකස් කිරීම.</u>

දිවයිනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 340න් 256 කින් මාර්ග ආරක්ෂණ සම්බන්ධීකරණ නිලධාරීන් නම් කොට මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවට යොමු කර ඇති අතර, බස්නාහිර පළාත නියෝජනය කරන නිලධාරීන් හට 2022.11.22 වන දින ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ඔවුන්ගේ කාර්යභාර්ය පැහැදිලි කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි. අනෙකුත් පළාත් සඳහා වන නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නියමිතයි.





ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී බස්නාහිර පළාත නියෝජනය කරන ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන් දැනුවත් කිරීම

## 05. <u>පළාත් මාර්ග ආරක්ෂණ ඒකක හරහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.</u>

දකුණු පළාත් මාර්ග ආරක්ෂණ ඒකකය මඟින් යොමු කර ඇති පොදු ප්‍රවාහන සේවයේ නියුතු රියදුරන් දැනුවත් කිරීමේ වැඩසටහන මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ මූල්‍ය දායකත්වයෙන් (රු.129,738) 2022.06.25 හා 26 යන දෙදින තුළ ගාල්ල කරිටාස් ආයතනයේදී පවත්වන ලදි.

පළාත් මාර්ග ආරක්ෂණ ඒකක හරහා ප්‍රසිද්ධ ස්ථාන වල **LED** පුවරු හා නැවතුම්පලවල් ආශ්‍රිත **LED TV** මඟින් ප්‍රචාරය කිරීම සඳහා කෙටි වීඩියෝ පට 15 ක් සකස් කිරීමට අදාල ආයතන වෙත භාරදී ඇති අතර, සකස් කර ඇති කෙටි විඩියෝ පට, සංශෝධන සිදු කිරීමට මාර්ග ආරක්ෂාව පිළිබඳ සභාව වෙත යොමු කර ඇත.





පොදු ප්‍රවාහන සේවයේ නියුතු රියදුරන් දැනුවත් කිරීමේ වැඩසටහන 2022.06.25 -2022.06.26

## 06. දුම්රිය හරස් මාර්ග, දුම්රිය ස්ථාන හා දුම්රිය මාර්ග ආශ්‍රිතව දැනුවත් කිරීමේ පුවරු ස්ථාපිත කිරීමේ වැඩසටහන.

දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි, දුම්රිය මාර්ග ආශ්‍රිතව සිදුවන අනතුරු අවම කිරීම සඳහා පදිකයින් හා මගීන් දැනුවත් කිරීම සඳහා වන පුවරු දුම්රිය ස්ථාන 80 ක හා හරස් මාර්ග 160 ක පුවරු 480 ක් ස්ථාපිත කර ඇත.











දුම්රිය ස්ථානයන් හා දුම්රිය හරස් මාර්ග ආශ්‍රිතව මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මඟින් ස්ථාපිත කරන ලද පුවරු

# 07. රිය අනතුරු බහුල ප්‍රදේශයන් වල දැනුවත් කිරීමේ පුවරු ස්ථාපිත කිරීම.

## 7.1 අනතුරු බහුල කහතුඩුව රිලාවල මංසන්ධිය, රත්නපුර පොලිස් බල ප්‍රදේශයේ අනතුරු බහුල ස්ථාන වල පුවරු ස්ථාපිත කිරීම.

අනතුරු බහුල මංසන්ධියක් ලෙස මාධ්‍ය මඟින් ලද තොරතුර මත හඳුනා ගන්නා ලද අනතුරු බහුල කහතුඩුව රිලාවල මංසන්ධිය ආශ්‍රිතව රියදුරන් දැනුවත් කිරීමේ පුවරු 7 ක් හා රත්නපුර පොලිස් බල ප්‍රදේශය ආශ්‍රිතව ස්ථාන 6 ක දැනුවත් කිරීමේ පුවරු 12 ක් ස්ථාපනය කර ඇත. අදාල පුවරු ස්ථාපනය කිරීමෙන් පසු රිලාවල මංසන්ධිය ආශ්‍රිතව වාර්තාවී ඇත්තේ එක් රිය අනතුරක් පමණි.




රූපය 9 – මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මඟින් රිලාවල මන්සන්ධිය ආශ්‍රිතව ස්ථාපිත කරන ලද දැනුවත් කිරීමේ පුවරු




රූපය10 – මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මඟින් රත්නපුර පොලිස් බල ප්‍රදේශය ආශ්‍රිතව ස්ථාපිත කරන ලද දැනුවත් කිරීමේ පුවරු

## 7.2 රථ වාහන පොලිසිය / අනෙකුත් ආයතන මගින් හඳුනා ගන්නා ලද, රිය අනතුරු බහුල ප්‍රදේශයන් වල දැනුවත් කිරීමේ පුවරු ස්ථාපිත කිරීම

දෙනියාය පොලිස් බල ප්‍රදේශයේ රිය අනතුරු බහුල වශයෙන් සිදුවන ස්ථානයන් 10 ක රියදුරන් දැනුවත් කිරීමේ පුවරු 20 ක් ස්ථාපිත කර ඇත.







මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මඟින් දෙනියාය පොලිස් බල ප්‍රදේශයේ රිය අනතුරු බහුල වශයෙන් සිදුවන ස්ථානයන් ආශ්‍රිතව ස්ථාපිත කරන ලද දැනුවත් කිරීමේ පුවරු

## 08. පාසල් මාර්ග ආරක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

පාසල් මාර්ග ආරක්ෂණ කලාප ස්ථාපිත කිරීම හා ඊට සමගාමීව මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩමුළු පවත්වන ලදි.

| අනු අංකය | දිනය | වැඩමුළුව පවත්වන ලද පාසල |
|---|---|---|
| 01 | 2022.03.18 | දෙනියාය මධ්‍ය විද්‍යාලය |
| 02 | 2022.03.19 | දෙනියාය රාජපක්ෂ විද්‍යාලය |
| 03 | 2022.09.19 | දඹුල්ල පනාපිටිය මහ විද්‍යාලය |
| 04 | 2022.10.01 | මාවනැල්ල මෙඩේරිගම විදයාලය |
| 05 | 2022.10.03 | රුවන්වැල්ල රාජසිංහ මහා විද්‍යාලය |




මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මඟින් ස්ථාපිත කරන ලද මාර්ග ආරක්ෂණ කලාපයක්




මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මඟින් පවත්වන ලද පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහනක්

## 09. <u>මාර්ග ආරක්ෂණ ජාතික සතියට අදාලව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.</u>

සෑම වසරකම නොවැම්බර් මාසයේ තුන්වන ඉරිදා දිනට යෙදෙන මාර්ග රිය අනතුරු වලට ලක්වූ වින්දිතයින් සිහිකරීමේ ජාත්‍යන්තර දිනයට සමගාමීව 2022 වර්ෂයේ නොවැම්බර් 21 සිට 25 දක්වා මාර්ග ආරක්ෂණ සතියක් පවත්වන ලදි. එහි සමාරම්භක උත්සවය 2022.11.21 දින මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේදී ගරු රාජ්‍ය අමාත්‍ය, ලසන්ත අලගියවන්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි. ඒ අනුව පහත වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කිරීමට මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව කටයුතු කරන ලදි.

### 9.1 මාර්ග රිය අනතුරු සම්බන්ධයෙන් වන පෝස්ටර් චිත්‍ර තරඟයක් පැවැත්වීම.

ජාත්‍යන්තර වින්දිත දිනයට සමගාමීව සමස්ත දිවයිනම ආවරණය වන පරිදි 9 ශ්‍රේණියෙන් ඉහළ දරුවන් සඳහා මාර්ග අනතුරු අවම කිරීම සම්බන්ධ පෝස්ටර් චිත්‍ර තරඟයක් පැවැත්වීමට කටයුතු කරන ලදි. ඒ අනුව පාසල් අයදුම් කරුවන් 246 තරගය සඳහා ඉදිරිපත් වූ අතර, එයින් ජයග්‍රහනය කළ දරුවන් සඳහා ත්‍යාග හා සහතික පත් ලබා දීම සිදු කරන ලදි.




මාර්ග රිය අනතුරු සම්බන්ධයෙන් වන පොස්ටර් චිත්‍ර තරඟය - මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය

## 9.2 රිය අනතුරු වලට ලක්වූ අඩු ආදායම්ලාභීන්ට මූල්‍ය සහන ලබා දීම.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව විසින් රිය අනතුරට ලක් වූ අඩු ආදායම්ලාභීන්ට මූල්‍ය සහන ලබා දීම කොළඹ දිස්ත්‍රික්කය හා ගම්පහ දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් සිදු කරන ලදි. එහිදී කොළඹ දිස්ත්‍රික්කයේ අඩු ආදායම්ලාභීන් 13 දෙනෙකු සඳහා රු.195,000.00 ක මුදලක් මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේදී ගරු රාජ්‍ය අමාත්‍ය ලසන්ත අලගියවන්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ලබා දීම සිදු කරන ලදි.

ගම්පහ දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් මාර්ග රිය අනතුරු වලට ලක් වූ අඩු ආදායම්ලාභීන් 26 දෙනෙකු සඳහා රු. 390,000.00 මුදලක් ගරු රාජ්‍ය අමාත්‍ය ලසන්ත අලගියවන්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවනාගාරයේදී සිදු කරන ලදි.





රිය අනතුරට ලක් වූ අඩු ආදායම්ලාභීන්ට මූල්‍ය සහන ලබා දීම - මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය



රිය අනතුරට ලක් වූ අඩු ආදායම්ලාභීන්ට මූල්‍ය සහන ලබා දීම - ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

## 9.3 පොදු ප්‍රවාහන සේවයේ නිරත රියදුරන් සඳහා වන වෛද්‍ය සායනයක් පවත්වන ලදි.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය සමග එක්ව පොදු ප්‍රවාහන සේවයේ නිරත රියදුරන් සඳහා මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේදී වෛද්‍ය සායනයක් පැවැත්වූ අතර, ඒ සඳහා රියදුරන් 100 සහභාගී වන ලදි. එහිදී රියදුරන්ගේ උස, බර, රුධිරය, අක්ෂි පරික්ෂාව හා රුධිර පීඩනය පරික්ෂා කිරීම සිදු කරන ලදි.

## 9.4 පොදු ප්‍රවාහන සේවයේ රියදුරන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව හා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය එක්ව පොදු ප්‍රවාහන සේවයේ නියුතු ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ රියදුරන් සඳහා මාර්ග අනතුරු අවම කිරීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ සභාපතිතුමන්ගේ හා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් 2022.11.23 දින පැවැත්වූ අතර, ඒ සඳහා රියදුරන් 100 ක් සහභාගීවන ලදි.




ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ රියදුරන් දැනුවත් කිරීම- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ප්‍රධාන කාර්යාලය

## 9.5 කොළඹ මහනගර සභාවේ මාර්ග ආරක්ෂණ ළමා උද්‍යානයට බයිසිකල් ලබා දීම.

ආරක්ෂිතව මාර්ගය භාවිත කිරීම පිළිබඳව පාසල් අවධියේ සිටම දැනුවත් භාවයක් ඇති කිරීම සඳහා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව හා කොළඹ මහ නගර සභාව එක්ව විහාරමහාදේවී උද්‍යානයේ මාර්ග ආරක්ෂණ ළමා උද්‍යානයක් ස්ථාපිත කළ අතර, ඊට අවශ්‍ය පාපැදි ලබා දීම 2022.11.29 වන දින ප්‍රවාහන රාජ්‍ය අමාත්‍ය ලසන්ත අලගියවන්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා කොළඹ නගරාධිපති රෝසි සේනානායක මැතිනියගේ සහභාගීත්වයෙන් කොළඹ විහාරමහාදේවි ළමා උද්‍යාන පරිශ්‍රයේදී සිදු කරන ලදි. ඒ සඳහා කොළඹ අවට පාසල් වල පාසල් සිසු සිසුවියන් සහභාගී විය.



කොළඹ මහනගර සභාවේ මාර්ග ආරක්ෂණ ළමා උද්‍යානයට බයිසිකල් ලබා දීම - විහාරමහා දේවී ළමා උද්‍යානය

## 9.6 ලේ දන්දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

ජාත්‍යන්තර වින්දිත සතියට සමගාමීව 2022.11.25 දින ලේ දන්දීමේ වැඩසටහනක් ගරු රාජ්‍ය අමාත්‍ය ලසන්ත අලගියවන්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මරදාන ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යාංශ පරිශ්‍රයේදී සිදු කරන ලදි.




ලේ දන්දීමේ වැඩසටහන - මරදාන ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යාංශ පරිශ්‍රය

## 10. <u>හප්පා පළා ගිය වාහන වලින් අනතුරට පත් වින්දිතයන්ට මූල්‍ය සහන ලබාදීම</u>

ස්ථාවර කමිටුවේ සහ ජාතික සභාවේ අනුමැතිය ලද වින්දිතයින් සඳහා 2022 වර්ෂයට අදාලව අවස්ථා හයකදී මූල්‍යාධාර ලබා දීම සිදු කරන ලදි.

| දිනය | ස්ථානය | වින්දිතයින් ප්‍රමාණය | ගෙවන ලද වන්දි මුදල රු. ලක්ෂ |
|---|---|---|---|
| 2022.03.29 | මරදාන ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යාංශය පිහිටි මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා කාර්යාලය | 13 | 2,450,000.00 |
| 2022.05.26 | මරදාන ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යාංශය පිහිටි මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා කාර්යාලය | 15 | 3,050,000.00 |
| 2022.08.30 | මරදාන ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යාංශය පිහිටි මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා කාර්යාලය | 14 | 2,300,000.00 |
| 2022.10.31 | මරදාන ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යාංශය පිහිටි මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා කාර්යාලය | 15 | 2,650,000.00 |
| 2022.11.21 | මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය | 12 | 2,650,000.00 |
| 2022.12.23 | මරදාන ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යාංශය පිහිටි මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා කාර්යාලය | 5 | 1,150,000.00 |
| **එකතුව** | | **74** | **14,250,000.00** |





හප්පා පළා ගිය වාහන වලින් අනතුරට පත් වින්දිතයන්ට මූල්‍ය සහන ලබාදීම - මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය.

## 11. අධිවේගී මාර්ගයේ ගමන් ගන්නා රියදුරන් දැනුවත් කිරීම සඳහා අත්පත්‍රිකා මුද්‍රණය කර රථවාහන පොලිස් මූලස්ථානයට ලබා දීම.


අධිවේගී මාර්ගයේ ගමන් ගන්නා රියදුරන් දැනුවත් කිරීම සඳහා රු.මි. 1.7 ක පිරිවැයක් දරා අත්පත්‍රිකා 200,000 ක් මුද්‍රණය කර අදාල අත්පත්‍රිකා බෙදාදීම සඳහා අධ්‍යක්ෂ, අධිවේගී මාර්ග කොට්ඨාසය වෙත ලබාදී ඇති අතර, ජාතික පොලිස් දිනය නිමිති කර ගනිමින් ක්‍රියාත්මක සතියේ එක් වැඩසටහනක් ලෙස 2022.09.05 වන දින කොට්ටාව අධිවේගි මාර්ග පිවිසුමේදී එහි සමාරම්භය සිදු කරන ලදි.




2022.09.05 වන දින කොට්ටාව අධිවේගි මාර්ග පිවිසුමේදී අධිවේගී මාර්ගයේ ගමන් ගන්නා රියදුරන් දැනුවත් කිරීමේ අත්පත්‍රිකා බෙදා දීම.

## 12. නවක රියදුරු බලපත්ලාභීන් හා රියදුරු බලපත්‍ර ඉල්ලුම්කරුවන් කෙටි පණිවිඩ මගින් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

නවක යතුරුපැදි රියදුරු බලපත්‍රලාභීන් හා රියදුරු බලපත්‍ර ඉල්ලුම්කරුවන් රියදුරු බලපත්‍ර ඉල්ලුම් කරනු ලබන අවස්ථාවේදී හා බලපත්‍ර ලබා ගන්නා අවස්ථාවේදී කෙටි පණිවුඩ මගින් දැනුවත් කිරීම සඳහා මොටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ රු.මි. 1.5 ක මූල්‍ය දායකත්වයෙන් ක්‍රියාත්මක කරනු ලබන කෙටි පණිවිඩ (SMS) මගින් දැනුවත් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා මේ වන විට ප්‍රසම්පාදන කටයුතු අවසන් කර මොබිටෙල් ආයතනයට යොමු කර ඇත.




රියදුරන් දැනුවත් කිරීම සඳහා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මගින් රියදුරු බලපත්‍ර ඉල්ලුම්කරුවන් හා රියදුරු බලපත්‍ර ලාභීන්ට යොමු කරන කෙටි පණිවුඩය.

## 13. <u>මාර්ග ආරක්ෂාව පිළිබඳව සහ හප්පා පළාගිය රිය අනතුරකදී ගෙවනු ලබන මූල්‍ය සහන යෝජනා ක්‍රමය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම.</u>

හප්පා පලාගිය රිය අනතුරු වලට ලක්වන පුද්ගලයින් සඳහා ලබාදෙන වන්දි සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම සඳහා සිංහල හා දෙමළ මාධ්‍යයෙන් දැනුවත් කිරීමේ X- පුවරු හා රු.මි. 2.16 ක වියදමින් අත්පත්‍රිකා 50,000 ක් මුද්‍රණය කර ඇති අතර, ශ්‍රී ලංකා පොලීසිය වෙත බෙදා දීමට කටයුතු සිදුකර ඇත.




හප්පා පලාගිය රිය අනතුරු වලට ලක්වන පුද්ගලයින් සඳහා ලබාදෙන වන්දි සම්බන්ධයෙන් වන අත්පත්‍රිකාව






හප්පා පලාගිය රිය අනතුරු වලට ලක්වන පුද්ගලයින් සඳහා ලබාදෙන වන්දි සම්බන්ධයෙන් වන x පුවරු

## 14. <u>ලොරි රථ රියදුරන්, ත්‍රිරෝද රථ රියදුරන් සහ යතුරුපැදිකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.</u>

මාර්ග රිය අනතුරු සඳහා වැඩි වශයෙන් බලපාන ලොරි රථ රියදුරන් මාර්ග ආරක්ෂාව පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා රු.මි. 0.5 ක් වෙන් කරන ලද අතර, 2022.09.02 දින රු. 151,900 ක වියදමක් දරා මනම්පිටිය මහවැලි ප්‍රතිභා ශාලාවේදී පවත්වන ලදි.




මනම්පිටිය මහවැලි ප්‍රතිභා ශාලාවේදී 2022.09.02 පවත්වන ලද ලොරි රථ රියදුරන් දැනුවත් කිරීමේ වැඩසටහන

## 2022 වර්ෂයෙහි දිවයිනේ සිදුවූ රිය අනතුරු සංඛ්‍යාව

| වර්ෂය | මාරක | බරපතල | සුලු | අලාභ | එකතුව | මියගිය |
|---|---|---|---|---|---|---|
| **2022** | **2395** | **6231** | **8209** | **5118** | **21953** | **2515** |

## 2022 වර්ෂයෙහි මියගිය සංඛ්‍යාව

| කාණ්ඩය | 2022 |
|---|---|
| යතුරුපැදිකරුවන් | **865** |
| පසුපැදිකරුවන් | **200** |
| පදිකයින් | **674** |
| මගීන් | **297** |
| රියදුරන් | **217** |
| පාපැදිකරුවන් | **225** |
| වෙනත් | **37** |
| එකතුව | **2515** |

| **2022 වසර තුල මාරක අනතුරු වලට වගකිව යුතු වාහන** | |
|---|---|
| **වගකිව යුතු වාහනය** | **2022** |
| | **මාරක අනතුරු** |
| යතුරුපැදි | 908 |
| ලොරි | 320 |
| ත්‍රීවිල් | 285 |
| ද්විත්ව කාර්ය වාහන | 271 |
| කාර් | 227 |
| පුද්ගලික බස් | 172 |
| ලංගම බස් | 63 |
| ට්‍රැක්ටර් | 29 |
| පාපැදි | 29 |
| කන්ටේනර් | 29 |
| ඉඩම් වාහන | 08 |
| හජ්පා පළායැම් | 54 |
| **එකතුව** | **2395** |

**<u>මාර්ග ආරක්ෂණ අරමුදලට දායකත්වය සපයනු ලබන ලියාපදිංචි රක්ෂණ ආයතන.</u>**

| | | | |
|---|---|---|---|
| 01. | අමානා ටකාෆුල් රක්ෂණ සමාගම | - | නො 660 1/1, ගාලු පාර, කොළඹ - 03. |
| 02. | අලියාන්ස් රක්ෂණ සමාගම | - | නො 675, ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ - 09. |
| 03. | සෙලින්කෝ රක්ෂණ සමාගම | - | 3 වන මහල, "සෙලින්කෝ නිවාස", නො 69, ජනාධිපති මාවත, කොළඹ - 01. |
| 04. | කොන්ටිනෙන්ටල් රක්ෂණ සමාගම | - | නො 79, සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මාවත, කොළඹ - 07 |
| 05. | සී./ස. සමූපාකාර රක්ෂණ සමාගම | - | නො 74/05, ග්‍රෑන්ඩ්පාස් පාර, කොළඹ - 14. |
| 06. | එච්.එන්.බී. රක්ෂණ සමාගම | - | ව්‍යාපාර මධ්‍යස්ථානය, නො 30, ශ්‍රී උත්තරානන්ද මාවත, කොළඹ - 03. |
| 07. | එල්.ඕ.එල්.සී. රක්ෂණ සමාගම | - | නො 481, ටී.බී ජයා මාවත, කොළඹ - 10. |
| 08. | ජාතික රක්ෂණ භාර අරමුදල | - | නො 95, UPTO හවුස්, ශ්‍රී චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ -02. |
| 09. | එම්.බී.එස්.එල් රක්ෂණ සමාගම | - | නො 519, ටී.බී ජයා මාවත, කොළඹ - 10 |
| 10. | ඔරියන්ට් රක්ෂණ සමාගම | - | නො.133, නව බුලර්ස් පාර,කොළඹ 04. |
| 11. | පීපල්ස් රක්ෂණ සමාගම | - | නො 07, හැව්ලොක් පාර, කොළඹ - 05. |
| 12. | සී/ස සණස රක්ෂණ සමාගම | - | නො. 172, ඇල්විටිගල මාවත, කොළඹ - 08. |
| 13. | ශ්‍රී ලංකා රක්ෂණ සමාගම | - | රක්ෂණ මන්දිරය, නො 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02 |
| 14. | ෆෙයාෆස්ට් රක්ෂණ සමාගම | - | නො 33, ශාන්ත මයිකල් පාර, කොළඹ 03. |

# මූල්‍ය ප්‍රකාශන - 2022

**මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව**

**2022 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන සටහන්**

| | සටහන් | 2022<br>රු. | 2021<br>(නැවත ප්‍රකාශ කළ)<br>රු. |
|---|---|---|---|
| ලැබීම් | | | |
| රක්ෂණ සමාගම් වෙතින් ලද දායකත්වය | 3 | 72,177,175.66 | 51,719,745.46 |
| වෙනත් ආදායම් | 4 | 58,390,437.91 | 22,081,742.45 |
| **මුළු ආදායම** | | **130,567,613.57** | **73,801,487.91** |
| **වියදම් අඩුකළා** | | | |
| පරිපාලන වියදම් | 5.1 | 11,748,469.91 | 8,062,673.54 |
| මාර්ග ආරක්ෂාව කළමනාකරන වැඩසටහන් | 5.2 | 49,709,582.20 | 40,233,821.35 |
| | | - | - |
| **වියදමට වඩා ආදායමේ අතිරික්තය** | | **69,109,561.46** | **25,504,993.02** |

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

2022 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය


| | සටහන් | **2022** | **2021** |
|---|---|---|---|
| | | | නැවත ප්‍රකාශ කරන ලද |
| | | රු | රු |
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 6 | 1,918,738.56 | 5,308,722.68 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **1,918,738.56** | **5,308,722.68** |
| භාණ්ඩාගාර බිල්පත් | 7 | 321,543,535.44 | 282,381,122.40 |
| ස්ථාවර තැන්පතු | 8 | 185,167,086.79 | 177,523,869.46 |
| **ජංගම වත්කම්** | | | |
| රක්ෂණ සමාගම් වලින් ලැබිය යුතු | 3 | 6,038,024.51 | 7,037,439.32 |
| භාණ්ඩාගාර බිල්පත් සඳහා ලැබිය යුතු පොළිය | 7 | 7,671,047.22 | 1,763,859.33 |
| ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොළී | 8 | 8,043,475.95 | 3,782,897.38 |
| පූර්ව ගෙවීම් | | 26,783.09 | 133,375.08 |
| බැංකුගත මුදල් | 9 | 47,858,688.01 | 31,111,579.92 |
| **මුළු ජංගම වත්කම්** | | **69,638,018.78** | **43,829,151.03** |
| **ජංගම බැඳීම් අඩුකළා** | | | |
| ගෙවියයුතු විගණන ගාස්තු | | 221,400.00 | 200,000.00 |
| ගෙවියයුතු වෙනත් ගෙවීම් | | 127,546.45 | 32,818.91 |
| | | 348,946.45 | 232,818.91 |
| **මුළු වත්කම්** | | **577,918,433.12** | **508,810,046.66** |
| **මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභා අරමුදල් ගිණුම** | | | |
| අරමුදල් ගිණුමේ ශේෂය ඉදිරියට ගෙනාවා | | 508,808,871.66 | 483,303,878.64 |
| වියදමට වඩා ආදායමේ අතිරික්තය | | 69,109,561.46 | 25,504,993.02 |
| **මුළු අරමුදල්** | | **577,918,433.12** | **508,808,871.66** |

සුවිශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 5 සිට 14 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවලටම අයත් කොටස් වේ.

**සහතික කිරීම**

ඉහත මූල්‍ය ප්‍රකාශන මගින් 2021 දෙසැම්බර් 31 දින දක්වා වන කටයුතු පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන බව සහ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන අතිරික්තය /(හිඟය) අපි සහතික කරමු. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මෙම සභාව වගකීම දරයි.මෙම මූල්‍ය ප්‍රකාශන සභාව විසින් අනුමත කර අත්සන් කරන ලදී.








ගණනකාධිකාරී (වැඩ ආවරණ)
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

ලේකම්
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

## මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
## 2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා වක්‍ර ක්‍රම මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2022 | 2021 |
|---|---|---|
| | | නැවත ප්‍රකාශ කළ |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | **රු.ශ.** | **රු. ශ.** |
| බදු පෙර ලාභය | 69,109,561.46 | 25,504,993.02 |
| *ගැලපීම්* | | |
| පූර්ව වර්ෂයේ ගැලපීම් (ශුද්ධ) | (1,175.00) | - |
| අවප්‍රමාණවීම | 810,629.91 | 1,229,117.82 |
| ස්ථාවර වත්කම් ප්‍රදාන | 3,803,686.15 | - |
| පොලී ආදායම | (58,390,437.91) | (22,081,742.45) |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය** | 15,332,264.61 | 4,652,368.39 |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්** | | |
| වෙනත් ලැබිය යුතු ලැබීම් වල වැඩිවීම/(අඩුවීම) | (9,061,759.66) | (2,675,983.80) |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ගෙවීම් වල වැඩිවීම/(අඩුවීම) | 116,127.54 | (149,104.74) |
| **මෙහෙයුම් වලින් ජනිත වූ මුදල්** | (8,945,632.12) | (2,825,088.54) |
| | - | - |
| මෙහෙයුම් වලින් ජනිත වූ ශුද්ධ මුදල | 6,386,632.49 | 1,827,279.85 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මූල්‍ය ප්‍රවාහය** | | |
| දේපල පිරියත හා උපකරණ මිළට ගැනීම | (1,224,331.94) | (40,324.00) |
| ලැබූ පොළිය | 58,390,437.91 | 22,081,742.45 |
| ස්ථාවර තැන්පත් ප්‍රති ආයෝජන | (7,643,217.33) | (34,722,264.26) |
| භාණ්ඩාගාර බිල්පත් ප්‍රති ආයෝජන | (39,162,413.04) | (13,306,201.93) |
| **ආයෝජන කටයුතු සඳහා භාවිත ශුද්ධ මුදල** | 10,360,475.60 | (25,987,047.74) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | |
| කොටස් ප්‍රාග්ධනය නිකුත් කිරීමෙන් ලැබෙන මුදල් | - | - |
| දිගුකාලීන ණය ගැනීම් වලින් ලැබෙන මුදල් | - | - |
| මූල්‍ය බදු බැඳීම් ගෙවීම | - | - |
| ලාභාංශ ගෙවීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා භාවිත ශුද්ධ මුදල | - | - |
| **මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම** | **16,747,108.09** | **(24,159,767.89)** |
| **කාලසීමාව ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ** | **31,111,579.92** | **55,271,347.81** |
| **කාලසීමාව අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ** | **47,858,688.01** | **31,111,579.92** |

**මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව**
**2022 දෙසැම්බර් 31 දිනට**
**හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය**

| | අරමුදල් ගිණුම<br>රු. | එකතුව<br>රු. |
|---|---:|---:|
| 2017/12/31 දිනට ශේෂය | 260,040,799.57 | 260,040,799.57 |
| | | - |
| වියදමට වඩා ආදායමේ අතිරික්තය (නැවත ප්‍රකාශ කිරීම) | 40,561,344.97 | 40,561,344.97 |
| 2018/12/31 දිනට ශේෂය | 300,602,144.54 | 300,602,144.54 |
| වියදමට වඩා ආදායමේ අතිරික්තය (නැවත ප්‍රකාශ කිරීම) | 59,487,763.56 | 59,487,763.56 |
| 2019/12/31 දිනට ශේෂය (නැවත ප්‍රකාශ කිරීම) | 360,125,892.14 | 360,125,892.14 |
| වියදමට වඩා ආදායමේ අතිරික්තය (නැවත ප්‍රකාශ කිරීම) | 61,315,294.39 | 61,315,294.39 |
| 2020/12/31 දිනට ශේෂය | 421,441,186.53 | 421,441,186.53 |
| වියදමට වඩා ආදායමේ අතිරික්තය | 61,862,692.11 | 61,862,692.11 |
| 2021/12/31 දිනට ශේෂය | 483,303,878.64 | 483,303,878.64 |
| වියදමට වඩා ආදායමේ අතිරික්තය (නැවත ප්‍රකාශ කිරීම) | 25,504,993.02 | 25,504,993.02 |
| 2021/12/31 දිනට ශේෂය | 508,808,871.66 | 508,808,871.66 |
| වියදමට වඩා ආදායමේ අතිරික්තය | 69,109,561.46 | 69,109,561.46 |
| | - | - |
| 2022/12/31 දිනට ශේෂය | 577,918,433.12 | 577,918,433.12 |

**මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව**
**2022 දෙසැම්බර් 31 දිනට**
**හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය**

## 1 ආයතනික තොරතුරු

### 1.1 පොදු තොරතුරු

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මෝටර් රථ වාහන (සංශෝධිත) පනත මගින් පිහිටුවන ලද අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි. මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ලියාපදිංචි කාර්යාලය අංක 01, ඩී ආර් විජේවර්ධන මාවත, කොළඹ 10 ස්ථානයේ පිහිටි අමාත්‍යාංශ ගොඩනැගිල්ලෙහි ස්ථාපිතව ඇත.

## 2 සුවිශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

### 2.1 පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

#### 2.1.1 සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් මුදල් ඒකකයෙන් ඉදිරිපත් කර ඇති අතර ඒවා ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් සකස් කළ, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රකාරව ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර තිබේ.

#### 2.1.2 <u>අනුකූලතා ප්‍රකාශය</u>

2022 දෙසැම්බර් 31 වන දිනට හා එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්ය සාධනය, සම කොටස් හා මුදල් ප්‍රවාහවල වෙනස්කම් සහ සභාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර තිබේ.

### 2.2 <u>වත්කම් සහ ඒවායේ තක්සේරු පදනම</u>

#### 2.2.1 <u>දේපල, පිරියත, උපකරණ</u>

(a) දේපල, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂයවීම් අඩු කර පිරිවැයට අනුව සටහන් කෙරේ. 2018 දී වත්කම් නැවත ඇගයීමක් සිදු කළ අතර එම දිනයේ තිබූ වත්කම් වලින් සමුච්චිත ක්ෂය අඩුකර නැවත ඇගයීම් කළ වටිනාකමට අනුව පවත්වාගෙන යනු ලැබේ.

ආ. ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ සරල රේඛා පදනමක් භාවිතා කිරීමෙනි වත්කම ඵලදායී අයුරින් භාවිතයට ගතහැකි දිනයේ සිට ගණනය කරනු ලබන, වත්කමේ ඵලදායි ආයු කාලය පුරා මෙම ප්‍රතිපත්තිය අදාළ කර ඇත.

ප්‍රධාන වාර්ෂික ගාස්තු පහත පරිදි භාවිතා වේ

| | | |
|---|---|---|
| 1 . | පරිගණක | 25% |
| 2. | ඡායාපිටපත් / මුද්‍රණ යන්ත්‍රය | 12.5% |
| 3. | වායු සමකරණය | 12.5% |
| 4 . | යන්ත්‍ර හා වෙනත් දේපල | 12.5% |
| 5 . | ගෘහ භාණ්ඩ සහ උපාංග | 10 % |
| 6 . | රියදුරු ඉගෙනුම් යන්ත්‍ර | 10% |
| 7 . | කැමරා උපකරණ සහ ශීතකරණ | 25% |
| 8 . | වෙනත් මාධ්‍ය උපකරණ | 12.5% |

දේපල, පිරියත සහ උපකරණවල ක්ෂයවීම් අනුපාත

## 2.3 <u>ආයෝජන</u>

මාර්ග ආරක්ෂණ අරමුදලට දායක මුදල් මාසික පදනමින් රක්ෂණ සමාගම් වෙතින් ලැබෙන අතර අමතර අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල සහ ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කෙරේ. වත්මන් ආයෝජන පිරිවැය මත ප්‍රකාශ කර ඇති අතර භාණ්ඩාගාර බිල්පත් වලින් ලැබෙන පොලී ආදායම කල් පිරෙන විට නැවත ආයෝජනය කෙරේ.

### (a) වර්තමාන ආයෝජන

වත්මන් ආයෝජන පිරිවැය මත ප්‍රකාශ කර ඇති අතර භාණ්ඩාගාර බිල්පත් වලින් ලැබෙන පොලී ආදායම නැවත කල් පිරෙන විට ආයෝජනය කෙරේ.

**2.4 <u>වගකීම් සහ ප්‍රතිපාදන</u>**

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වත්මන් වගකීම් යටතේ ප්‍රකාශ කර ඇති වගකීම් යනු මූල්‍ය තත්වයේ දිනයේ සිට වසරක් ඇතුළත ගෙවීම් කාලය කල්පිරෙන බව අපේක්ෂා කරන බැඳීම් වේ.

**<u>2.4. 1 ගෙවිය යුතු වෙනත් ගෙවීම්</u>**

ණයහිමියන් සහ අනෙකුත් ගෙවිය යුතු දේ ඔවුන්ට අදාලව පොත් වල දැක්වෙන වටිනාකම් වලින් දක්වා ඇත.

**<u>2.4.2 ප්‍රතිපාදන</u>**

සම්පත් පිටතට ගලායාමකට හේතුවන පරිදි, පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සභාවට වර්තමාන වගකීමක් ඇති විට ප්‍රතිපාදන හඳුනා ගැනේ. ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කිරීම වගකීම් නිරවුල්කිරීමට ආර්ථික ප්‍රතිලාභ අවශ්‍ය වනු ඇති අතර වගකීම් ප්‍රමාණය අනුව විශ්වාසනීය ඇස්තමේන්තු කිරීමක් සිදු කළ හැක.

**2.5 <u>මාර්ග ආරක්ෂණ අරමුදලේ ආදායම්</u>**

ලියාපදිංචි වාහන රක්‍ෂණ සමාගම් 14ක් සියලුම තුන්වන පාර්ශ්ව රක්ෂණ ඔප්පු වලින් 1%ක් ලබා දී ඇත. 2021 ඔක්තෝබර් 01 සිට එය 2% දක්වා වැඩි වේ. රක්ෂණ සමාගම් ඔවුන් ගෙවිය යුතු මාසිකදායකත්ව වාරික ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙරගෙවිය යුතුය.

**2.6 <u>කාර්ය මණ්ඩල</u>**

ජාතික මාර්ග ආරක්ෂණ ලේකම් කාර්යාලය යනු මාර්ග ආරක්ෂාව පිළිබඳ වන ජාතික සභාව ක්‍රියාත්මක කිරීමේ ආයතනයයි. අනෙකුත් සහායක කාර්ය මණ්ඩලය අමාත්‍යාංශයෙන් මාර්ග ආරක්ෂක ලේකම් කාර්යාලයට මාරු කර එවා ඇත. ප්‍රවාහන. අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ වැටුප ප්‍රවාහන අමාත්‍යාංශය විසින් ගෙවනු ලැබේ.

**<u>2.7දෝෂ</u>**

කවුන්සිලයේ පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ අතීතානුයෝගීව දක්වා ඇති නිවැරදි පූර්ව කාල මූර්ත දෝෂ පහත සඳහන් දේ තුළින් අනාවරණය කර ගැනීමෙන් පසු නිකුත් කිරීම සඳහා අවසර දී ඇත.

(එ) දෝෂ සිදුව ඇති, ඉදිරි

පත් කරන ලද පූර්ව කාල පරිච්ඡේද සඳහා සංසන්දනාත්මක ප්‍රමාණයන් නැවත සඳහන් කිරීම; හෝ

(බි) ඉදිරිපත් කරන ලද මුල්ම පූර්ව කාල පරිච්ඡේදයට පෙර දෝෂය සිදු වූයේ නම්, ඉදිරිපත් කරන ලද මුල්ම පූර්ව කාල පරිච්ඡේදය සඳහා අදාල වත්කම්, වගකීම් සහ ශුද්ධ වත්කම්/සම කොටස්වල ආරම්භක ශේෂයන් නැවත සඳහන් කිරීම.

මෙම වසර තුළදී පෙර මූල්‍ය ප්‍රකාශයේ යම් යම් දෝෂ හමු වූ අතර ඒවා 2021 මූල්‍ය ප්‍රකාශනය තුළ නැවත ප්‍රකාශ කිරීමෙන් නිවැරදි කරන ලදී. දෝෂයේ ස්වභාවය, 2021 දී කලින් ඉදිරිපත් කරන ලද සහ නැවත ප්‍රකාශ කිරීම මගින් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය මත ඇතිවූ බලපෑමට අදාල ශේෂයන් පහතින් සාරාංශ කර ඇත.

***2022 වර්ෂයේ දෝෂ නිවැරදි කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිවූ වෙනස්වීම් වල බලපෑම සහ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය මත එහි බලපෑම***

**මූල්‍ය කාර්යසාධන පිළිබඳ ප්‍රකාශය මත බලපෑම**

| **අයිතමය ප්‍රකාශ කළ** | **සටහන** | **නැවත ප්‍රකාශ කිරීමට පෙර ශේෂය** | **ගැලපීම්** | **නැවත නැවත ප්‍රකාශ කළ ශේෂය** |
|---|---|---|---|---|
| **ආදායම** | | | | |
| 2022 වර්ෂයට ස්ථාවර තැන්පොලී ආදායම | 2.7 .1 | 8,373,694.00 | (495,296.00) | 7,878,398.00 |

| **වියදම්** | **සටහන** | **නැවත ප්‍රකාශ කිරීමට පෙර ශේෂය** | **ගැලපීම්** | **නැවත ප්‍රකාශ කළ ශේෂය** |
|---|---|---|---|---|
| ක්ෂය | 2.7.2 | 1,231,331.82 | (2,214.00) | 1,229,117.82 |

**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය මත බලපෑම**

| **අයිතමය** | **සටහන** | **නැවත ප්‍රකාශ කළ ශේෂය** | **ගැලපීම්** | **නැවත ප්‍රකාශ කිරීමට පෙර ශේෂය** |
|---|---|---|---|---|
| ලැබිය යුතු ස්ථාවර තැන්පොලී | 2.7.1 | 4,278,193.42 | (495,296.00) | 3,782,897.42 |
| පිපිර් | 2.7.2 | 5,306,508.68 | 2214.00 | 5,308,722.68 |

2.7.1 –J/E 16

2021 දෙසැම්බර් 31 වන දිනට ස්ථාවර තැන්පත් වලින් ලැබිය යුතු පොළිය රු. 3,782,897.38 වන අතර එය රුපියල් 4,278,193.42 ක් ලෙස වැරදි ලෙස 2021 මූල්‍ය ප්‍රකාශනෙයහි. සටහන් විය. මේ හේතුවෙන් ස්ථාවර තැන්පත් පොළිය රු. 495296.04 ක වැඩි අගයකින් සටහන් විය මෙය 2021 මූල්‍ය ප්‍රකාශනවල නැවත ප්‍රකාශ කිරීමෙන් නිවැරදි කරනු ලැබේ.

2.7.2 – J/E 17

වෙනත් වත්කම් ක්ෂය වීම 2021 දී රුපියල් 2,214.00 ක වැඩි අගයකින් යුතුව සටහන් කර ඇති අතර 2021 මූල්‍ය ප්‍රකාශන නැවත ප්‍රකාශ කිරීම මගින් නිවැරදි කරනු ලැබේ.

**03. 2022 වර්ෂය සඳහා රක්ෂණ සමාගම් වෙතින් ලැබුණු දායකත්වය**

| | සටහන් අංකය | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|---|
| වසර තුළ රක්ෂණ දායකත්ව ලැබීම් | 3.1 | 73,176,590.47 | 48,564,451.46 |
| රක්ෂණ දායකත්ව එකතු කළා | | | |
| ලැබිය යුතු රක්ෂණ දායකත්ව ආරම්භක ශේෂයෙන් | | 6,038,024.51 | 7,037,439.32 |
| | | 79,214,614.98 | 55,601,890.78 |
| අඩු කළා | | | |
| ලැබිය යුතු රක්ෂණ දායකත්ව ආරම්භක ශේෂයෙන් | | 7,037,439.32 | 3,882,145.32 |
| | | **72,177,175.66** | **51,719,745.46** |

### *3.1 වසර තුළ රක්ෂණ දායකත්ව ලැබීම්*

| රක්ෂණ සමාගමේ නම | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| හැටන් නැෂනල් රක්ෂණ සමාගම | 239,500.00 | 202,910.00 | 199,725.00 | 197,965.00 | 135,570.00 | 125,490.00 | 196,865.00 | 192,435.00 | 225,350.00 | 157,962.00 | 151,824.00 | 157,803.00 | 2,183,399.00 |
| අමානා ටකාෆුල් රක්ෂණ සමාගම | 321,728.02 | 287,528.86 | 295,260.13 | 300,493.70 | 237,308.35 | 215,217.87 | 212,765.46 | 196,205.65 | 792,057.58 | 244,326.24 | 233,057.78 | 259,271.04 | 3,595,220.68 |
| සෙලින්කෝරක්ෂණ සමාගම | 824,135.32 | 867,868.00 | 812,939.00 | 820,184.00 | 523,000.80 | 509,661.00 | 547,382.00 | 725,083.00 | 925,539.00 | 710,988.00 | 891,746.00 | 750,831.00 | 8,909,357.12 |
| එම් බී එස් එල් රක්ෂණ සමාගම | - | 183,054.00 | 169,219.30 | - | 79,749.80 | 153,368.50 | - | 65,112.90 | 99,710.30 | 83,104.40 | 86,016.10 | 81,222.50 | 1,000,557.80 |
| සමුපකාර රක්ෂණ සමාගම | 945,537.00 | 945,537.00 | 790,073.00 | 746,012.00 | 433,138.00 | 420,904.00 | 501,548.28 | 616,593.00 | 935,532.00 | 774,147.00 | 912,851.00 | 856,343.00 | 8,878,215.28 |
| ඔරියන්ට් රක්ෂණ සමාගම | 92,370.64 | 279,202.72 | 163,951.92 | 153,841.36 | 96,351.64 | 105,156.88 | 127,846.68 | 118,486.88 | 135,272.56 | 160,512.04 | 151,383.56 | 156,635.44 | 1,741,012.32 |
| සණස රක්ෂණ සමාගම | 271,883.32 | 258,812.44 | 237,622.10 | 241,210.70 | 183,923.60 | 147,333.76 | 184,083.88 | 181,023.88 | 307,907.64 | 217,256.54 | 242,478.60 | 214,293.54 | 2,687,830.00 |
| ආලියාන්ස් ලංකා සමාගම | 488,160.00 | 476,690.00 | 469,662.00 | 419,510.00 | 257,440.00 | 292,062.00 | 318,740.00 | 399,730.00 | 468,030.00 | 413,986.00 | 471,720.00 | 457,225.00 | 4,932,955.00 |
| ශ්‍රී ලංකා රක්ෂණ සමාගම | 1,901,811.00 | 1,791,398.00 | 1,661,644.00 | 1,753,906.00 | 1,027,538.00 | 1,133,821.00 | 1,292,018.00 | 1,457,224.00 | 1,987,692.00 | 1,557,399.00 | 1,746,091.00 | 1,699,673.00 | 19,010,215.00 |
| පීපල්ස් ඉන්ෂුවරන්ස් රක්ෂණ සමාගම | 379,811.02 | 403,207.35 | 366,312.73 | 348,278.23 | 194,924.55 | 158,369.46 | 202,097.94 | 288,135.90 | 306,288.09 | 309,983.01 | 372,554.26 | 300,867.74 | 3,630,830.28 |
| කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා සමාගම | 149,731.00 | 149,846.00 | 140,552.00 | 147,217.00 | 87,058.00 | 96,077.00 | 129,998.00 | 125,735.00 | 161,573.00 | 140,341.00 | 147,219.00 | 145,811.00 | 1,621,158.00 |
| ලංකා ඔරික්ස් ලීසින් රක්ෂණ සමාගම | 235,532.00 | 804,957.00 | 519,962.00 | 440,213.00 | 315,650.00 | 359,652.00 | 522,417.00 | 436,140.00 | 520,583.00 | 549,743.00 | 462,789.00 | 499,113.00 | 5,666,751.00 |
| ජාතික රක්ෂණ භාර අරමුදල | - | - | | 187,287.30 | 61,439.69 | | 69,107.47 | 36,060.41 | 69,526.83 | 37,808.38 | 52,261.15 | 47,112.76 | 560,603.99 |
| ෆෙයාෆර්ස්ට් රක්ෂණ සමාගම | 1,004,186.00 | 829,389.00 | 862,715.00 | 783,909.00 | 507,332.00 | 490,292.00 | 848,733.00 | 801,080.00 | 958,742.00 | 412,602.00 | 723,292.00 | 536,213.00 | 8,758,485.00 |
| | | | | | | | | | | | | | |
| එකතුව | **6,854,385.32** | **7,480,400.37** | **6,689,638.18** | **6,540,027.29** | **4,140,424.43** | **4,207,405.47** | **5,153,602.71** | **5,639,045.62** | **7,893,804.00** | **5,770,158.61** | **6,645,283.45** | **6,162,415.02** | **73,176,590.47** |

**මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව**
**2022 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන සටහන්**

**04. වෙනත් ආදායම්**

| | සටහන | 2022 | 2021 |
|---|---|---|---|
| | | රු. | රු. |
| භාණ්ඩාගාර බිල්පත් පොලී | 7 | 45,069,600.93 | 13,708,048.68 |
| ස්ථාවර තැන්පතු පොලී | 8 | 13,320,836.98 | 8,373,693.78 |
| | | 58,390,437.91 | 22,081,742.45 |

**මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව**

**2022 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන සටහන්**

**05. වියදම්**

**5.1 පරිපාලන වියදම්**

| | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|
| වැටුප් සහ වේතන | 900,000.00 | 899,700.00 |
| ඉන්දන දීමනාව | 626,690.00 | 308,730.00 |
| ප්‍රවාහන දීමනාව | 300,000.00 | |
| දුරකථන දීමනාව | 64,786.61 | - |
| වෙනත් දීමනා | 344,682.69 | 982,080.51 |
| ඉන්දන හා ලිහිසි ද්‍රව්‍ය | 604,076.00 | 403,647.57 |
| සභා සහ කමිටු සාමාජික ගාස්තු | 402,000.00 | 443,000.00 |
| පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ නඩත්තුව | 469,534.65 | 791,052.25 |
| වාහන නඩත්තුව | 242,611.00 | 14,732.05 |
| ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 905,667.99 | 169,268.15 |
| විදුලිය, දුරකථන සහ ජලය | 251,274.46 | 151,695.04 |
| පුවත්පත් | 61,540.00 | 68,240.00 |
| මුද්‍රණය සහ පරිවර්තනය | 109,767.50 | 746,892.50 |
| අතිකාල ගාස්තු | 506,187.31 | 365,197.65 |
| රැස්වීම් සඳහා සංග්‍රහ | 105,329.65 | 51,793.00 |
| විගණන ගාස්තු | | |
| මෙම වසර සඳහා විගණන ගාස්තු | 221,400.00 | 200,000.00 |
| පෙර වර්ෂයේ ඌන (අධික) ප්‍රතිපාදන | | 22,600.00 |
| ගමන් වියදම් | 142,436.00 | 294,872.00 |
| ක්ෂය | 810,629.91 | 1,229,117.82 |
| තැපැල් ගාස්තු | 43,870.00 | 17,715.00 |
| බැංකු ගාස්තු | 1,000.00 | 16,000.00 |
| පුහුණුලාභී දීමනා | - | 7,500.00 |
| පිරිසිදු කිරීමේ ගාස්තු | 732,400.00 | 734,400.00 |
| විවිධ වියදම් | 98,899.99 | 144,440.00 |
| පරිත්‍යාග | 3,803,686.15 | - |
| | **11,748,469.91** | **8,062,673.54** |

**5.2 මාර්ග ආරක්ෂණ කළමනාකරණ වැඩසටහන් සඳහා වියදම්**

| | සටහන් | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|---|
| මාර්ග ආරක්ෂණ කළමනාකරණ වැඩසටහන් | 5.2.1 | 32,609,582.20 | 33,858,821.35 |
| හප්පා පළා යාම් සඳහා වන්දි | | 17,100,000.00 | 6,375,000.00 |
| | | **49,709,582.20** | **40,233,821.35** |

**5.2.1 මාර්ග ආරක්ෂණ කළමනාකරණ වැඩසටහන් සඳහා වියදම්**

| වැඩසටහන | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|
| මාර්ග ආරක්ෂණ කළමනාකරණයේ ධාරිතාව වැඩි කිරීම | 2,088,750.00 | 107,127.00 |
| ආරක්ෂිත මාර්ග පද්ධතියක් නිර්මාණය කිරීම | 11,788,594.00 | 7,781,651.00 |
| මාර්ග භාවිතා කරන්නන්ගේ විනය ගොඩනැගීම | 18,732,238.20 | 25,970,043.35 |
| | **32,609,582.20** | **33,858,821.35** |

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව

**2022 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන සටහන්**

**06. දේපල, පිරියත සහ උපකරණ**

| | පරිගණක | ඡායාපිටපත් / මුද්‍රණ යන්ත්‍රය | ගෘහ භාණ්ඩ සහ උපාංග | වායු සමීකරණ | මාධ්‍ය උපකරණ | වෙනත් වත්කම් | රිය පැදවීම ඉගෙනුම් යන්ත්‍ර | ශීතකරණ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය / නැවත ඇගයීම** | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **2022.01.01** දිනට ශේෂය | 713,500.00 | 140,700.00 | 641,500.00 | 139,800.00 | 1,577,412.50 | 79,981.50 | 5,875,351.00 | 133,000.00 | 9,301,245.00 |
| *වර්ෂය තුළ* | | | | | | | | | - |
| එකතු කිරීම | - | 746,600.00 | 60,972.50 | 416,759.44 | - | - | - | - | 1,224,331.94 |
| බැහැර කිරීම් | - | - | - | - | - | - | 5,875,351.00 | - | 5,875,351.00 |
| **2022.12.31 දිනට ශේෂය** | **713,500.00** | **887,300.00** | **702,472.50** | **556,559.44** | **1,577,412.50** | **79,981.50** | **-** | **133,000.00** | **4,650,225.94** |
| **සමුච්චිත ක්ෂය** | | | | | | | | | |
| 2022.01.01 දිනට ශේෂය (නැවත ප්‍රකාශිත) | 685,536.25 | 68,151.56 | 359,240.00 | 67,715.63 | 905,763.84 | 35,159.88 | 1,794,799.00 | 76,156.16 | 3,992,522.32 |
| වසර සඳහා අය කිරීම | 27,963.75 | 36,105.70 | 68,605.17 | 31,033.95 | 326,807.81 | 9,997.68 | 276,865.85 | 33,250.00 | 810,629.91 |
| බැහැර කිරීම් | | | | | | | 2,071,664.85 | | |
| **2022.12.31 දිනට ශේෂය** | **713,500.00** | **104,257.26** | **427,845.17** | **98,749.58** | **1,232,571.65** | **45,157.56** | **-** | **109,406.16** | **2,731,487.38** |
| **ශුද්ධ පොත් වටිනාකම** | | | | | | | | | |
| 2022.12.31 දිනට | 27,963.75 | 72,548.44 | 282,260.00 | 72,084.37 | 671,648.66 | 44,821.62 | 4,080,552.00 | 56,843.84 | 5,308,722.68 |
| | | | | | | | **2071664.85** | | |
| **2022.12.31** දිනට | **-** | **783,042.74** | **274,627.33** | **457,809.86** | **344,840.85** | **34,823.94** | **-** | **23,593.84** | **1,918,738.56** |

සටහන

මාධ්‍ය උපකරණ වලට පහත අයිතම ඇතුළත් කර ඇත.

01. කැමරා සහ කැමරා උපාංග රු. 1,037,050.00

02. ප්‍රොජෙක්ටර් සහ වෙනත් මාධ්‍ය උපකරණ රු. 540,362.50

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව
**2021 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන සටහන්**

**07.** භාණ්ඩාගාර බිල්පත්

| බිල්පත් අංකය | **2022** දෙසැම්බර් **31** දිනට ආයෝජනය කළ මුදල | **2022** වසර සඳහා පොලී ආදායම | **2022** දෙසැම්බර් **31** දිනට ලැබිය යුතු පොළිය |
|---|---|---|---|
| 1 | 14,680,981.00 | 2,121,965.31 | 287,731.71 |
| 2 | 50,978,377.00 | 7,115,422.69 | 35,712.56 |
| 3 | 8,790,480.29 | 1,270,561.93 | 172,284.12 |
| 4 | 12,935,297.48 | 1,869,647.10 | 253,518.16 |
| 5 | 22,525,221.35 | 2,795,349.20 | 343,758.30 |
| 6 | 924,083.12 | 114,677.54 | 14,102.46 |
| 7 | 35,296,057.52 | 6,055,182.12 | 1,700,513.62 |
| 8 | 14,644,926.69 | 1,868,719.23 | 1,199,549.82 |
| 9 | 11,431,542.61 | 1,652,296.78 | 224,046.15 |
| 10 | 113,917,388.86 | 14,136,991.87 | 1,738,497.79 |
| 11 | 35,263,508.44 | 6,049,607.43 | 1,698,954.75 |
| 12 | 98,212.62 | 12,188.09 | 1,498.82 |
| 13 | 57,595.54 | 6,991.64 | 878.96 |
| එකතුව | **321,543,672.52** | **45,069,600.93** | **7,671,047.22** |

**08.** ස්ථාවර තැන්පතු

| ස්ථාවර තැන්පතු අංකය | ගිණුම් අංකය | මුදල | **2022** වසර සඳහා පොලී ආදායම | **2022** දෙසැම්බර් **31** දිනට ලැබිය යුතු පොලී ආදායම |
|---|---|---|---|---|
| 1 | 5052659 | 10,000,000.00 | 1,084,379.75 | 123,287.67 |
| 2 | 6462242 | 3,000,000.00 | 328,593.60 | 19,726.03 |
| 3 | 6061516 | 1,000,000.00 | 106,394.59 | 9,452.05 |
| 4 | 83251129 | 40,181,614.45 | 3,347,805.10 | 1,428,924.26 |
| 5 | 83250939 | 54,384,447.69 | 3,725,075.15 | 1,573,424.02 |
| 6 | 204-60-01-00023436-6 | 50,601,024.65 | 2,730,870.95 | 2,394,190.95 |
| 7 | 204-60-01-00026713-3 | 27,382,914.41 | 2,685,197.00 | 2,494,470.97 |
| | | **186,550,001.20** | **14,008,315.78** | **8,043,475.95** |

| **09.** බැංකුගත මුදල් | **2022** | **2021** |
|---|---|---|
| | රු. | රු. |
| බැංකු ශේෂය | 47,858,688.01 | 31,111,579.92 |
| හඳුනා නොගත් ලැබීම් | - | - |
| බැංකුගත මුදල් | 47,858,688.01 | 31,111,579.92 |

# විගණකාධිපති වාර්තාව - 2022

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } සිඔපී/සි/එන්.සි.ආර්.එස්/2022/එෆ්.ඒ

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2023 මැයි 22 දින

සභාපති,

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව.

**මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සමාලෝචිත වර්ෂය තුල දී සභාව වෙත ලැබී තිබූ මාර්ග සංඥා පුවරු වෙනුවෙන් ගෙවිය යුතු රු.6,586,736 කට අදාලව ගිණුම් වල වෙන්කිරීම් කර නොතිබීම හේතුවෙන් වර්ෂයේ වියදම් හා වගකීම් ඒම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ස්ථාවර තැන්පතුවල වටිනාකම රු.186,550,001 ක් වුවද මූල්‍ය තත්ව ප්‍රකාශයේ එය රු.185,167,087 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ස්ථාවර තැන්පතුවල වටිනාකම රු.1,382,914 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු පොළී ආදායම රු.14,008,316 ක් වුවද එය රු.13,320,837 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ස්ථාවර තැන්පතු පොළී ආදායම රු.687,479 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී ආදායම රු.7,348,671 ක් වුවද එය මූල්‍ය තත්ව ප්‍රකාශයේ රු.8,043,476 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී ආදායම රු.694,805 ක් වැඩියෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 සභාවේ වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සභාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සභාවේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම

ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

### 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හදුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන

බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව.

**2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

**2.1.1** මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

**2.1.2** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) **(III)** වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

**2.1.3** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 **(i)** (ඈ) **(iv)** වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනම කොටසේ 1.2 (අ) ජේදයේ දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ව ඇත.

**2.2** අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණු වලට සීමාකිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

**2.2.1** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සභාව හා සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

**2.2.2** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයටයොමුව | | | විස්තරය |
|---|---|---|---|
| (අ) | 1971අංක 38දරණ මුදල් පනතේ 8(1) වගන්තිය හා PED 12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2. 4වගන්තිය | | මුදල් වර්ෂය ආරම්භ වීමට මාස 03කට ප්‍රථම අයවැය ලේඛනය අනුමත කල යුතු වුවද සභාව විසින් අයවැය ලේඛනය අනුමත කර තිබුණේ 202 2 මාර්තු 30 දිනදීය. |
| (ආ) | 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | | |
| | (i) | 4.2. 6වගන්තිය. | කාර්තු ,අර්ධවාර්ෂික ,වාර්ෂික වශයෙන් ආයතනයේ කාර්ය සාධනය වාර්තා සමාලෝචනය කලයුතු වුවද සභාව විසින් සමාලෝචිත වර්ෂය තුල ප්‍රගති සමාලෝචන රැස්වීම් කිසිවක් පවත්වා නොතිබුණි. |
| | (ii) | 5.1. 3වගන්තිය. | මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15කට පෙර ක්‍රියාකාරී සැලැස්ම අනුමත කර අදාල ආයතනය වෙත යොමු කල |

| | | | | |
|---|---|---|---|---|
| | | | | යුතු වුවද 2022 ක්‍රියාකාරී සැලැස්ම සඳහා අනුමැතිය ලබා දී තිබුනේ 202 2 මාර්තු 30 දිනදීය. |
| (ඈ) | | 2017අගෝස්තු 14දිනැති ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අංක NP/5P/5dg/17 දරන චක්‍රලේඛය | | ආයතනය විසින් තිරසර සංවර්ධන ඉලක්කයන් 03ක් මාර්ග ආරක්ෂාවට අදාලව හඳුනා ගෙන තිබුණද විගණන දින වන විටත් චක්‍රලේඛය ප්‍රකාරව ආයතනයට අදාලව තිරසර සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි. |
| (ඇ) | | 2019 ජනවාරි 12 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක DMA/1 - 2019 දරන චක්‍රලේඛය **5.3 ඡේදය** | | චක්‍රලේඛය ප්‍රකාර වර්ෂයකට අවම වශයෙන් විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් වාර 04ක් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ රැස්වීම් වාර 01ක් පමණක් පවත්වා තිබුණි. |

**2.2.3** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව, කොමිෂන් සභාවක් ලෙස ස්ථාපනය කිරීම ප්‍රධාන අරමුණ කොට ගෙන ජාතික සභාව පිහිටුවා වසර 17ක් ගත වී ඇතත් 2023අප්‍රේල් 26 වන දිනය දක්වාම එය කොමිෂමක් ලෙස ස්ථාපිත කර නොතිබූ අතර ඒ හේතුවෙන් සභාවේ කාර්යයන් ඉටු කිරීමට නිතිමය බලතල ලැබී නොතිබුණු අතර විධිමත් කාර්ය මණ්ඩලයක් ද පත් කර ගැනීමට නොහැකි වී තිබුණි.

**2.2.4** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ සම්පත් සැකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

## 2.5 වෙනත් කරුණු

(අ) රජයේ ගිණුම් කාරක සභාව විසින් ලබා දී ඇති නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා 2021 වර්ෂයේ ජුලි මස සංශෝධිත අයවැය ලේඛනයක් හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර අධික වේගය නිසා සිදු වන මාර්ග අනතුරු අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබූ අතර, 2022වර්ෂයේදී අදාල වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට රු.මිලියන 150ක ප්‍රතිපාදනයන් වෙන් කර තිබුණද තාක්ෂණික උපකරණ මිලදී ගැනිම සඳහා සිදු කළ යුතු ප්‍රසම්පාදන කටයුතු අවසන් කර නොතිබීම හේතුවෙන් මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. ඒසේම ඉකුත් වර්ෂයේදීද ඉහත නියෝගය අනුව මෙම කාර්යය ඉටු කර නොතිබුණි.

(ආ) 2014පෙබරවාරි 17දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/ 2014(4) (ඇ (වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමඟ පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්මේ අදාල භාණ්ඩ ,සේවා සහ විවිධ ව්‍යාපෘති ඉටු කිරීම වෙනුවෙන් රු.මිලියන 335.14ක් වෙන් කර තිබුණද 2022 දෙසැම්බර් 31දින වන විට එම සැලැස්මේ රු.මිලියන 186.8 කට අදාල ප්‍රසම්පාදන කටයුතු 09ක් ඉටු කර නොතිබුණි.

(ඇ) ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් 2018සහ 2019වර්ෂවලදී සභාවට රු.මිලියන 1.7ක් ප්‍රේෂණය කර තිබූ අතර 2022වර්ෂය අවසානය දක්වාම එම මුදල් භාවිතා කර කිසිදු ව්‍යාපෘතියක් ඉටු කර නොතිබුණි.

(ඇ) සභාවේ ජංගම ගිණුමේ 2022 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 45ක මුදලක් පැවති අතර සභාවේ ආදායම් ලැබීම්වලින් මාසිකව වියදම් දැරීමට තරම් මුදල් ප්‍රමාණයක් රඳවා ගනිමින් අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබූ අතර 2022 දෙසැම්බර් 31 දිනට ආයතනය සතුව ජංගම ගිණුමේ රු.47,858,688ක ශේෂයක් පැවතුණි.

(ආ) අංක 2245/ 31හා 2021සැප්තැම්බර් 17දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ 2වගන්තිය ප්‍රකාරව සියයට 2ක රක්ෂණ දායකත්ව මුදල් අයකර ගතයුතු වුවද පෞද්ගලික රක්ෂණ ආයතන 2ක් සියයට 1ක දායකත්ව මුදලක් පමණක් ගෙවා තිබූ අතර අනෙක් සියයට 1ක මුදලට අදාල රුපියල් 1,262,404 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති.

**<u>මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන හා වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් වන කරුණු දැක්වීම්.</u>**

**<u>2.2.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා.</u>**

**<u>(අ) සභාව විසින් මුදල් වර්ෂය ආරම්භ වී 2022 මාර්තු 30දින අයවැය ලේඛනය අනුමත කර තිබුණි.</u>**

2022 වර්ෂය සඳහා සකස් කරන ලද මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ අයවැය ලේඛණය 2021.12.29 දින සභා පත්‍රිකා අංක 2021-17/06-01 මඟින් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද අතර,ඒ සඳහා ජාතික සභාවේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව 2022.01.04 වන දින අමාත්‍යාංශ ලේකම් ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි.එහිදී අමාත්‍යාංශය මඟින් දැනුම් දෙන ලද සංශෝධනයන් සිදුකිරීමෙන් අනතුරුව 2022.04.25 දින අමාත්‍යාංශය ලේකම්ගේ අනුමැතිය ලැබී ඇත.

2023 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය ලේඛණය සඳහා 2022.10.27 දින ජාතික සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව අදාල පාර්ශව වෙත යොමු කිරීමට කටයුතු කරන ලද බව වැඩිදුරටත් දන්වා සිටිමි.

**<u>(ආ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය.</u>**

**<u>(i) 4.2.6 වගන්තිය</u>**

2022 වර්ෂයට අදාලව සියලුම කාර්තු සඳහා මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ කාර්ය මණ්ඩලය සහභාගී කරගෙන සභාපතිගේ ප්‍රධානත්වයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් 2022.04.04,2022.08.10 හා 2022.09.15 යන දිනයන්හීදී පවත් වන ලද අතර, ඒ වනතෙක් අභ්‍යන්තර ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීමේදී රැස්වීම් වාර්තා පවත්වා නොගත් අතර, රජයේ විගණන අංශය මඟින් 2022.09.15 දින කරන ලද පැහැදිලි කිරීමට අනුව, 2022.09.15 දින සිට ප්‍රගති සමාලෝචන රැස්වීම් වාර්තා පවත්වාගෙන යාමට කටයුතු කරන ලදි.

අමාත්‍යාංශය මඟින් පවත්වනු ලබන වාර්ෂික ප්‍රගති සමාලෝචන රැස්වීම 2022.12.08 වන දින ප්‍රවාහන හා මාර්ග අමාත්‍යාංශයේ මරදාන පරිශ්‍රයේදී පවත්වන ලදි.

තවද, ඉදිරියේදීත් කාර්තුමය වශයෙන් අභ්‍යන්තර ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වාගෙන යාමටත් රැස්වීම් වාර්තා පවත්වා ගැනීමටත් කටයුතු කරන බවත් දන්වා සිටිමි.

**<u>(ii) 5.1.3 වගන්තිය</u>**

2022 වර්ෂය සඳහා සකස් කරන ලද මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ක්‍රියාකාරී සැලැස්ම 2021.12.29 දින සභා පත්‍රිකා අංක 2021-17/06-01 මඟින් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද අතර,ඒ සඳහා ජාතික සභාවේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව 2022.01.04 වන දින අමාත්‍යාංශ ලේකම් ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි.එහිදී අමාත්‍යාංශය මඟින් දැනුම් දෙන ලද සංශෝධනයන් සිදුකිරීමෙන් අනතුරුව 2022.04.19 දින නැවත අමාත්‍යාංශය ලේකම්ගේ අනුමැතියට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව MT/05/03/01-2022 මගින් 2022.04.25 දින ක්‍රියාකාරී සැලැස්ම සඳහා අනුමැතිය ලැබී ඇත.
ඉදිරියේදී ඔබ විසින් සඳහන් කරන ලද 2003 ජුනි 02 දිනැති PED/12 චක්‍රලේඛයට අනුව කටයුතු කරන බව තවදුරටත් දන්වමි.

**<u>(ඇ) තිරසාර සංවර්ධන සැලැස්මක් සකස් කර නොමැත.</u>**

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයක් ලෙසට ක්‍රියාත්මක වන ආයතනයක් බැවින් ආයතනයට අදාලව සුවිශේෂී තිරසාර සංවර්ධන සැලැස්මක් මේ වන තෙක් සකස් කර නොමැති අතර, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය මඟින් සකස් කරන තිරසාර සංවර්ධන සැලැස්ම සඳහා මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් ඇතුළත් විය යුතු කරුණු පිළිබඳව අමාත්‍යාංශයට අවශ්‍ය සහයෝගය මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මඟින් ලබා දීමට කටයුතු කරයි.

**(ඇ) විගණන හා කළමණාකරණය කමිටු.**

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ලේකම් ලෙස කටයුතු කල ඒ.එම්.ආර්.කේ.ජයසිංහ මහතා අනිවාර්ය විශ්‍රාම ගැන්වීමෙන් අනතුරුව 2022.04.25 දින දක්වා ලේකම් තනතුර පුරප්පාඩුව පැවති අතර, එම තනතුර සඳහා එවකට ප්‍රවාහන අමාත්‍යාංශය නියෝජනය කරන මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ සභා සාමාජික ලෙසට කටයතු කල ආර්.ඒ.කේ.රේණුකා , ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (දුම්රිය පාලන) පත් කරන ලදි.

ඒ අනුව පුරප්පාඩු වූ සභා සාමාජික තනතුර සඳහා පත් කරන ලද ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) කේ.ජී.එස්.දිනේෂා මිය මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ විගණන හා කළමණාකරණ කමිටු සාමාජික ලෙසට 2022.08.23 දින පත් කිරීමෙන් අනතුරුව 2022.09.07 වන දින විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම පවත්වන ලදි.

ඉදිරියේදී මෙවැනි ගැටළු මගහරවාගෙන විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් පවත්වන බව වැඩිදුරටත් සඳහන් කරමි.

**2.2.3. (අ) විධිමත් කාර්ය මණ්ඩලයක් අනුමත කරගෙන නොතිබීම හා කොමිෂන් සභාවක් ලෙස ස්ථාපිත කර නොතිබීම.**

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව ජාතික ප්‍රවාහන සුරක්ෂාව පිළිබඳ කොමිෂන් සභාව ලෙස ස්ථාපිත කිරීමට අදාලව සකස් කරන ලද පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කිරීමෙන් අනතුරුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සංශෝධන සහිතව 2022.03.29 දින හා 2022.05.18 දින නැවත ප්‍රවාහන අමාත්‍යාංශය වෙත යොමු කිරීමෙන් අනතුරුව නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමුකරන ලදි. 2022.12.16 වන දින රාජ්‍ය අමාත්‍යතුමා විසින් ලබාදුන් උපදෙස් අනුව පනත් කෙටුම්පත නැවත සංශෝධනය කර 2022.12.16 දින අතිරේක ලේකම් (සංවර්ධන ii) විසින් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සමඟ නීති නිලධාරී වෙත යොමුකල අතර , ඒ සඳහා වන නීතිපතිගේ යෝජනා මේ වන විට ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය වෙත ලැබී ඇත.ඒ අනුව අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.

**2.2.4.සැලසුම් කිරීම හා අයවැය පාලනය.**

පසු ගිය කාලසීමාව තුල රට තුළ පැවති ව්‍යාකූල ආර්ථික හා සමාජීය තත්වය හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වූ ක්‍රියාකාරී සැලැස්මෙහි ක්‍රියාකාරකම් හා 2023 වර්ෂය සඳහා යෝජනා කරන ලද ක්‍රියාකාරකම් වඩාත් ඵලදායී ආකාරයෙන් 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

**2.5 වෙනත් කරුණු.**

**(අ) රාජ්‍ය ගිණුම්කාරක සභාවෙ නියෝග ක්‍රියාත්මක කිරීම.**

ශ්‍රී ලංකා පොලීසියට රු.මි.150 කින් යුත් තාක්ෂණික උපකරණ ගබා දීමේ ව්‍යාපෘතිය සඳහා වන සම්මත ලංසු කැඳවීමේ ලේඛන සකස් කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය වෙත භාර දී ඇත.

2023.01.10 දින පැවති ප්‍රගති සමාලෝචන රැස්වීමේදී ප්‍රවාහන රාජ්‍ය ගරු අමාත්‍ය ලසන්ත අලගියවන්න මැතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලද්දේ මෙම කාර්ය ඉටු කිරීමට පෙර එහි ඵලදායීතාවය සම්බන්ධයෙන් යලි සමාලෝචනය කිරීමෙන් අනතුරුව අදාල භාණ්ඩ මිලදී ගැනීම සිදු කරන ලෙසයි.

**(ආ) රු.මි.186.8 කට අදාල ප්‍රසම්පාදන කටයුතු සිදු කර නොමැත.**

Implementation of programs to reduce Road accidents due to speeding ලෙස දක්වා ඇති රු.මි. 150 ක ඇස්තමේන්තුගත මුදලක් වෙන්කර ඇති රාජ්‍ය ගිණුම්කාරක සභාවේ නියෝගයක් ලෙස ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා පොලිසියට අවශ්‍ය තාක්ෂණික උපකරණ ලබා දීම සම්බන්ධයෙන් වන ප්‍රසම්පාදන කටයුතු ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබයි.

Preparation of a documentary video on road safety (Rs.1.7 m) සහ renovation of the Chairmen's office ( Rs.1 m) යන ව්‍යාපෘතීන් 2022.08.18 දින සිදුකරන ලද සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කරන ලද නව ව්‍යාපෘතීන් වන අතර, සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම, ක්‍රියාකාරි සැලැස්ම හා අයවැය ලේඛණය සඳහා ජාතික සභාවේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා 2022.11.02 දින අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාදෙන ලදි. එබැවින් 2022 වර්ෂය අවසාන වීමට පෙර එම ව්‍යාපෘති අවසන් කිරීමට නොහැකි විය.

Purchase of media equipment (Rs.2 M) සහ Projector machine (Rs.0.4 M), Buying Vehicle ( Rs.25.5 M) යන ව්‍යාපෘති 2022.08.18 දින ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කිරීමේදී ඉවත් කරන ලදි.

Steel wardrobes (Rs.1 M), Hand microphone compensator set and sound syst. ( R.s 1 M) සහ Purchase of LED panel and generator (Rs. 4.5 M) යන ව්‍යාපෘති 2022 වර්ෂයේදී පැවති ආනයන සීමා කිරීම් හේතුවෙන් ප්‍රසම්පාදන කටයුතු සිදු කර නොමැත.

ශ්‍රී ලංකා පොලීසිය මඟින් ලෝක සෞඛ්‍ය සංවිධානයේ ආධාර ඇතිව මධ්‍යම හා බස්නාහිර පළාත තුළ දැනට ක්‍රියාත්මක කරන මාර්ග රිය අනතුරු දත්ත කළමනාකරණ පද්ධතිය දීප ව්‍යාප්තව ස්ථාපිත කිරීම සඳහා ශ්‍රී ලංකා පොලීසියට අවශ්‍ය තාක්ෂණික උපකරණ මිලදී ගැනීම සඳහා වන සම්මත ලංසු කැඳවීමේ ලේඛණ හා පුවත්පත් දැන්වීම සකස් කර ඇති අතර පවත්නා ආනයන අපනයන රෙගුලාසි මත භාණ්ඩ ගෙන්වීම සඳහා ආනයන අපනයනන පාලකගේ අනුමැතිය ලබාගැනීම උචිත බව අමාත්‍යාංශ ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදි.ඒ අනුව, භාණ්ඩ ගෙන්වීම සඳහා ආනයන අපනයන පාලකගේ අනුමැතිය ලබාගැනීම සඳහා යොමු කර ඇත.2023.01.10 දින පැවති ප්‍රගති සමාලෝචන රැස්වීමේදී ප්‍රවාහන ගරු රාජ්‍ය අමාත්‍ය ලසන්ත අලගියවන්න මැතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලද්දේ මෙම කාර්ය ඉටු කිරීමට පෙර එහි උපයෝගීතාවය සම්බන්ධයෙන් යලි සමාලෝචනය කිරීමෙන් අනතුරුව අදාල භාණ්ඩ මිලදී ගැනීම සිදු කරන ලෙසයි.

**<u>(ඈ) ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් 2018 හා 2019 වර්ෂවලදී යොමු කරන ලද රු.මි.1.7 ක මුදල භාවිතා කර නොතිබීම.</u>**

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මඟින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සඳහා ජාතික සභා අරමුදලෙහි ඇති මුදල් උපයෝගී කර ගනු ලබයි. ලෝක සෞඛ්‍ය සංවිධානය මඟින් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවට යොමු කරන ලද මුදල් යම් නිශ්චිත ව්‍යාපෘතියක් සඳහා යොමු නොකරන ලද නිසා එම මුදල් ජාතික සභා අරමුදලට බැර කර ඇති බව දන්වා සිටිමි.

තවද, අදාල මුදල ලබා දීම සඳහා වූ පදනම සම්බන්ධයෙන් අවශ්‍ය විමර්ශණ කටයුතු සිදුකර එය යම් විශේෂ ව්‍යාපෘතියක් සඳහා ලබා දී ඇති නම් අදාල ව්‍යාපෘතිය ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

**<u>(ඇ) ජංගම ගිණුමේ 2022.12.31 දිනට රු.මි.45 ක මුදලක් පැවතීම.</u>**

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ජංගම ගිණුමේ 2023.03.31 දිනට පැවති අතිරික්ත මුදල වන රු.මි.40 ක මුදල මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ ජංගම ගිණුම පවතින ලංකා බැංකුවේ හයිඩ්පාර්ක් ශාඛාවේ මාස තුනකට වරක් යාවත්කාලීන වන පරිදි ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීමට මේ වන විටත් කටයුතු කර ඇත.

**<u>(ඉ) රක්ෂණ දායක මුදල් 2% දක්වා වැඩි වීමෙන් පසු පැවති 1% දායක මුදලම ලබා දීමට කටයුතු කරන ලද ආයතන සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග.</u>**

මේ සම්බන්ධයෙන් අදාල රක්ෂණ ආයතන දැනුවත් කිරීමට කටයුතු කර ඇති අතර, එම ආයතන වෙතින් අදාල මුදල් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව වෙත ලබා ගැනීමට කටයුතු සිදු කරන බවත් කාරුණිකව දන්වා සිටිමි.

**මලිත් ජයතිලක,**
සභාපති,
මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව